SINHALA 04

# රුපියල් බිලියන 1 ක ලාභයක් ඉක්මවමින් කොමර්ෂල් ක්‍රෙඩිට් අඛණ්ඩ වර්ධනයක් සනිටුහන් කරයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විසින් 2014 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 1 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇති බව නිවේදනය කර සිටී. මෙය පූර්ව 2012/13 මූල්‍ය වර්ෂයේ වාර්තා කරන ලද ශුද්ධ ලාභ අගය වූ රුපියල් බිලියන 0.7 හා සැසඳීමේ දී 48% ක වර්ධනයකි.

''කොමර්ෂල් ක්‍රෙඩිට් ඉතිහාසයේ මූල්‍ය වර්ෂයක් තුළ රුපියල් බිලියනය ඉක්මවූ ශුද්ධ ලාභයක් වාර්තා කළ පළමු අවස්ථාව මෙයයි. පසුගිය මූල්‍ය වර්ෂය තුළ දී මූල්‍ය සේවා කර්මාන්තය මුහුණ දුන් අභියෝග හමුවේ මෙවැනි ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම සැබැවින්ම සුවිශේෂී සංධිස්ථානයක් වනවා'', යැයි මෙහිදී අදහස් දක්වමින් කොමර්ෂල් ක්‍රෙඩිට් හි ප්‍රධාන විධායක නිලධාරී රොෂාන් එගොඩගේ මහතා කියා සිටියේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් එගොඩගේ මහතා කියා සිටියේ, සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී සමාගමේ සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 31.6 දක්වා 73.1% කින් වර්ධනය වී ඇති බවයි. එමෙන්ම අදාළ කාලපරිච්ඡේදය තුළ දී සමාගම විසින් රුපියල් බිලියන 6.9 ක පොළී ආදායමක් වාර්තා කර ඇති අතර එය 74.5% ක ඉහළ යාමකි.

''පසුගිය වසර ගණනාවක් පුරාවට අප විසින් වාර්තා කළ යහපත් කාර්යසාධනයේ ප්‍රතිඵලයක් ලෙස මෙම වර්ධනය හඳුන්වන්න පුළුවන්. මේ සඳහා වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ අපගේ ණය දීම් අංශයයි'', යනුවෙන් එගොඩගේ මහතා පැවසීය.

කොමර්ෂල් ක්‍රෙඩිට් හි සභාපති සිසිල් පෙරේරා මහතා මෙහිදී අදහස් දක්වමින් කියා සිටියේ පසුගිය කාලය පුරාවට සමස්ත දිවයිනම ආවරණය වන පරිද්දෙන් සිය සේවා ජාලය කැපී පෙනෙන ව්‍යාප්තියක් සිදුකර ඇති බවයි. ''මෙම ව්‍යාප්තියත් සමඟම කොමර්ෂල් ක්‍රෙඩිට් හි ව්‍යාපාරික කටයුතු තවදුරටත් පුළුල් කළ හැකි පසුබිමක අප දැන් පසුවෙනවා. 2013/ 14 මූල්‍ය වර්ෂය තුළ දී සමාගමේ ශාඛා ජාලය 60 සිට 75 දක්වා ව්‍යාප්ත වී තිබෙනවා. එහිදී ශාඛා ව්‍යාප්ත කිරීමේ දී හුදෙක් වර්තමාන හා අනාගත ව්‍යාපාරික අවස්ථා පිළිබඳ පමණක්ම සමාගමේ අවධානය යොමු වුණේ නැහැ. ඊට අමතරව අදාළ ප්‍රදේශවල සිටින ජනගහනය පිළිබඳව ද අප සැලකිලිමත් වුණා. අපගේ තැන්පතු පදනම 73.7% කින් වර්ධනය වීම කොමර්ෂල් ක්‍රෙඩිට් සමාගම පිළිබඳව ජනතාව තුළ ඇති විශ්වාසය කදිමට කියාපාන්නක් බව මෙහිදී කිව හැකියි'' යනුවෙන් පෙරේරා මහතා සඳහන් කළේය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා, ''ඕනෑම සංවිධානයක සාර්ථකත්වයේ පදනම වන්නේ ඒ පිළිබඳව සිය ගනුදෙනුකරුවන් තුළ ඇති විශ්වාසය හා පැහැදීමයි. මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ මෙවැනි සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට හැකි වූයේ අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා පැහැදීම මනාව තහවුරු කරලීමට අප සමත් වූ නිසයි'', යනුවෙන් පැවසීය.

2016 වසර වන විට ශ්‍රී ලංකාව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිත අගය ඇමරිකානු ඩොලර් 4,000 ක සීමාව කරා යන ඉදිරි සංවර්ධන සැලසුම් මනා කොට සාක්ෂාත් කරගනිමින් සිටින බව බලධාරීන්ගේ විශ්වාසයයි. එහිදී කොමර්ෂල් ක්‍රෙඩිට් වැනි මූල්‍ය ආයතනවලට මෙකී සංවර්ධන ක්‍රියාදාමයට බොහෝ අවස්ථාවන් උදාකරලමින් නව්‍ය මෙන්ම වේගවත් වර්ධනයකට අවශ්‍ය දායකත්වය ලබා දීමේ ඉඩකඩ ලැබී තිබේ. ''අපගේ වේගයෙන් ව්‍යාප්ත වන සේවා ජාලය හා අති විශාල මෙන්ම ලෙන්ගතු ගනුදෙනුකාර පදනම නිසා කර්මාන්තය තුළ සුවිශේෂී ස්ථානයක් අත්පත් කර ගැනීමට කොමර්ෂල් ක්‍රෙඩිට් මේ වන විට සමත් වී තිබෙනවා'', යැයි පෙරේරා මහතා කියා සිටියේය.

සමාගමේ විශිෂ්ට කාර්යසාධනය හා අනාගත විභවයන් පිළිබඳ මනා තහවුරුවක් ලබා දෙමින් ලොව ප්‍රමුඛ පෙළේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජකයෙකු වන ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ හි Creation Investments Capital Management LLC සමාගම රුපියල් බිලයන 1.68 ක ආයෝජනයක් එහි පූර්ණ පරිපාලිත සමාගමක් වන Creation Investments Sri Lanka LLC හරහා සිදුකර තිබේ. මෙය අන්තර්ජාතික පුද්ගලික හිමිකම් ආයෝජන අරමුදලක් විසින් මෙරට ලැයිස්තුගත බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් තුළ සිදුකරන ලද විශාලතම ආයෝජනය වන අතර එය කොමර්ෂල් ක්‍රෙඩිට් හි ඉදිරි සාර්ථකත්වය සඳහා ශක්තිමත් දායකත්වයක් සපයනු ඇත.

කොමර්ෂල් ක්‍රෙඩිට් විසින් ඇතිකර ගත් මෙම බැඳීම හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා කර්මාන්තය වෙතට, සංවර්ධනය වෙමින් පවතින කලාපීය වෙළෙඳපොළවල ආයෝජන අවස්ථා පිළිබඳ උනන්දුවක් දක්වන ජාත්‍යන්තර ආයෝජකයින්ගේ අවධානය ලබා ගැනීමට ඉදිරියේ දී හැකිවන බව අපගේ විශ්වාසයයි. Creation Investments සමඟ ඇතිකර ගත් මෙම සහයෝගීතාව ඉදිරි වර්ෂවල දී දෙපාර්ශවයටම ජයග්‍රාහී ප්‍රතිඵල අත්කර දෙන බව නියත වශයෙන් කිව හැකියි'', යනුවෙන් සභාපති සිසිල් පෙරේරා මහතා මෙහිදී අවසාන වශයෙන් කියා සිටියේය.